# කාර්ය සාධන වාර්තාව - 2015

## ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

පිටු අංකය


| | | | |
|---|---|---|---|
| 1. | දැක්ම, මෙහෙවර, කාර්යයන් සහ වගකීම් | | 02 |
| 2. | දෙපාර්තමේන්තුවේ ඒකක සහ අංශ | | 03 |
| 3. | ආංශික කාර්යය සාධනය | | 04 |
| | **3.1** | කෘෂිකර්ම, පශුසම්පත් , වාරිමාර්ග , ඉඩම් හා ධීවර | 04 |
| | **3.2** | විදුලිබල හා බලශක්ති | 08 |
| | **3.3** | ආර්ථික යටිතල පහසුකම් , ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා ගුවන්සේවා | 09 |
| | **3.4** | නිවාස, නාගරික සංවර්ධන, ජල හා සනීපාරක්ෂක සහ පරිසර | 11 |
| | **3.5** | කර්මාන්ත , වෙළඳ , සංචාරක, කම්කරු හා විදේශ රැකියා | 15 |
| | **3.6** | සෞඛ්‍ය, සංස්කෘතික, ජාතික උරුමයන්, ජාතික ඒකාබද්ධතා දේශීය වෛද්‍ය | 17 |
| | **3.7** | අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන , තොරතුරු තාක්ෂණ , විද්‍යා තාක්ෂණ | 18 |
| | **3.8** | සාර්ව ආර්ථික | 23 |
| | **3.9** | ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ | **24** |
| | **3.10** | රාජ්‍ය කළමනාකරණය | 23 |
| **4.** | සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය | | **27** |
| **5.** | මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය | | **28** |
| **6.** | මූල්‍ය කාර්ය සාධනය | | **36** |

## 01. දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

**දැක්ම**

දැයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශනය හා පහසුකම් සපයන්නා වීම

**මෙහෙවර**

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙනඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම.

**ප්‍රධාන කාර්යයන්**

**(i)** මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන සැලසුම්, රාජ්‍ය අයෝජන වැඩ සටහන් සම්පාදනය කිරීම සහ ආංශික සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම සඳහා රේඛීය ආයතන වලට සහාය වීම.

**(ii)** සාර්ව ආර්ථික රාමුව සහ උපාය මාර්ග වැඩි දියුණු කිරීම.

**(iii)** ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති, අදාළ උපාය මාර්ග සහ වැඩසටහන් විමසුමට ලක්කිරීම සහ ව්‍යාපෘති ඇගයීම.

**(iv)** වාර්ෂික ප්‍රාග්ධන අයවැය සැකසීම සඳහා තාක්ෂණික සහාය සැපයීම.

**(v)** ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති ලේඛනය සකස් කිරීම හා යාවත් කාලීන කිරීම.

**(vi)** ව්‍යාපෘති සැලසුම් කරණය හා ප්‍රතිපත්ති සම්පාදනයට අදාළව දෙපාර්තමේන්තුව වෙත පවරණු ලබන විශේෂ පැවරුම් ක්‍රියාත්මක කිරීම.

## 02. දෙපාර්තමේන්තුවේ ඒකක හා අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 08 කට වෙන් කර ඇත. එම අංශ 08 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 26 කට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

<u>**දෙපාර්තමේන්තුවේ අංශ**</u>

- කෘෂිකර්ම , වාරි මාර්ග , ඉඩම් හා පශු සම්පත් හා ධීවර
- විදුලි බල හා බලශක්ති
- ආර්ථික යටිතල පහසුකම් , ප්‍රවාහන, මාර්ග, වරාය හා ගුවන් සේවා
- නිවාස , නාගරික සංවර්ධන, ජල හා සනීපාරක්ෂක සහ පරිසර
- කර්මාන්ත , වෙළෙඳ , සංචාරක , කම්කරු හා විදේශ රැකියා
- සෞඛ්‍ය , සංස්කෘතික , ජාතික උරුමයන් , ජා.ික ඒකාබද්ධතා හා දේශීය වෛද්‍ය
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන, තොරතුරු තාක්ෂණ හා විද්‍යා හා තාක්ෂණ
- සාර්ව ආර්ථික සංවර්ධන ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ
- රාජ්‍ය කළමනාකරණ සහ යහපාලනය
- විමධ්‍යගත අයවැය (ඩීසීබී)

මීට අමතරව දෙපාර්තමේන්තුවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා පහත අංශ 3 ද ඇත.

**1.** සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය

**2.** පරිපාලන අංශය

**3.** මූල්‍ය අංශය

# 03. ආංශික කාර්ය සාධනය

## 3.1 කෘෂිකර්ම හා වාරි මාර්ග අංශය

**කෘෂිකර්ම :-**

කෘෂිකර්ම අංශය මඟින් දළ දේශීය නිෂ්පාදිතයට ඇති දායකත්වය පසුගිය වසර කිහිපය තුළදී අඩුවන ප්‍රවණතාවයක් පෙන්නුම් කළද ශ්‍රම බලකායෙන් සියයට 28.5ක් (2014 වසරේදී) සහ කෘෂිකර්ම පාදක කරගත් කර්මාන්ත හා සේවා සඳහා අමුද්‍රව්‍ය සපයමින් කෘෂිකර්ම අංශය ශ්‍රී ලංකා ආර්ථිකයේ කොඳුනාරටිය ලෙස අඛණ්ඩව ක්‍රියා කරයි. අගය දාමයේ සම්බන්ධතා හා ඒකාබද්ධ වෙමින් මෙම අංශය අනෙකුත් සියළුම අංශ සහ සම්පූර්ණ ආර්ථිකයේ වර්ධනයට දායක වේ.

**කෘෂිකාර්මික බෝග ක්ෂේත්‍රය**

වී, එළවළු, ක්ෂේත්‍ර බෝග, පළතුරු, කුළුබඩු ඇතුළු අපනයන බෝග, මල් සහ විසිතුරු පැළෑටි යන වගාවන් කෘෂිකාර්මික බෝග ක්ෂේත්‍රය යටතට ගැනේ. දළ වශයෙන් හෙක්ටයාර් මිලියන 0.9ක පමණ මෙම බෝග වගාව පවතින අතර ඉන් ප්‍රධාන තැනක් ගනු ලබන වී සමස්ථ බිම් ප්‍රමාණයෙන් සියයට 70ක පමණ ව්‍යාප්තියක පැතිර පවතී. 2015 වර්ෂයේ කෘෂිකාර්මික බෝග ක්ෂේත්‍රය සඳහා වන සමස්ථ ප්‍රාග්ධන ආයෝජනය රු. බිලියන 4.8 ක් පමණ වන අතර ඊට අමතරව පොහොර සහනාධාරය සඳහා රු. බිලියන 35ක් පමණ වැයකර ඇත.

**විශේෂ වැඩසටහන්**

- "ආසියාවේ සහල්" නමින් "Economist" සඟරාවේ පලවූ වාර්තාවක් පදනම් කරගනිමින් ශ්‍රී ලංකාවේ වී / සහල් ක්ෂේත්‍රය සඳහා රජයේ මැදිහත් වීම පිළිබඳව හැඳින්වීමක් ඉදිරිපත් කිරීම.
- පුවත්පතක පළකිරීම සඳහා "වී ගොවිතැනේ ප්‍රහේලිකාව" නමින් වාර්තාවක් සැකසීම.
- උතුරු නැගෙනහිර සංවර්ධන සැලැස්මේ කෘෂිකාර්මික අංශයේ සංවර්ධන ක්‍රියාකාරකම් ගොනු කිරීම.
- පොළොන්නරුව සංවර්ධන සැලැස්මේ කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරකම් ගොනු කිරීම.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් අවසන් කරන ලද ක්‍රියාකාරකම්**

- ව්‍යාපෘති යෝජනා 08ක් ඇගයීමට ලක්කර නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 04ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් එවන ලද විදේශීය ආධාර යටතේ වන ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ වාර්තා 02ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

- කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාල ව්‍යාපෘති ලැයිස්තුවක් සකස් කිරීම.

- ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් වලට සහභාගී වීම.

## වැවිලි

### වැවිලි කර්මාන්ත අංශය

වැවිලි ක්ෂේත්‍රය ප්‍රධාන වශයෙන් තේ,රබර් සහ පොල් යන බෝග වලින් සමන්විත වන අතර දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට දෙකක දායකත්වයක් සපයමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ඊට අමතරව උක්, කටුපොල්, කජු සහ තල් වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනයට දායක වේ. කුඩා පරිමාණ වැවිලිකරුවන් මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන ලබන අතර සමස්ථ නිෂ්පාදනයෙන් සියයට 70ක් සඳහා දායක වේ. ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ රජය සතු වැවිලි සමාගම් ඉතිරි සියයට 30 සපයනු ලබයි.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශය මඟින් සම්පූර්ණ කරන ලද කාර්යයන්

- ව්‍යාපෘති යෝජනා 30 ඇගයීමට ලක්කර අදාල නිර්දේශ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- වැවිලි ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ 05ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් එවන ලද විදේශීය ණය මත ක්‍රියාත්මක වීමට යෝජිත ව්‍යාපෘතිය සම්බන්ධ වාර්තාවක් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම.

## පශු සම්පත්

ජනතාවගේ ජීවනෝපාය නඟා සිටුවීම සඳහා විවිධ අංශ හරහා දායකත්වයක් ලබා දෙනු ලබන පශු සම්පත් අංශය ප්‍රධාන වශයෙන් කිරිගව, කුකුළු, සූකර සහ එළුවන් යන උප අංශ වලින් සමන්විත වේ.

මෙම අංශය වර්තමානයේ සමස්ථ දළ දේශීය නිෂ්පාදිතය සඳහා 0.8% දායකත්වයක් ලබා දෙමින් මෙරට තුළ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීමටත්, රැකියා උත්පාදනයටත්, ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමටත් හේතු වී ඇත.

2015 වර්ෂයේ පශු සම්පත් අංශය සඳහා සමස්ථ රාජ්‍ය ආයෝජනය රුපියල් මිලියන 8490 වේ. මූලධන වියදම් ලෙස රු. මිලියන 8490 වෙන්කර ඇති අතර එය ප්‍රධාන වශයෙන් කිරිගවයන් ආනයනය, මිල්කෝ

සමාගම සතු කර්මාන්තශාලා නවීකරණය, සත්ව රෝග නිවාරණය, පශු සම්පත් ආශ්‍රිත පර්යේෂණ හා නිපුණතා සංවර්ධන වැඩසටහන් සඳහා ආයෝජනය කර ඇත.

- උතුරු නැගෙනහිර සංවර්ධන සැලැස්ම සඳහා පශු සම්පත් අංශයේ වැඩසටහන් සකස් කිරීමට දායක වීම.
- ව්‍යාපෘති වාර්තා 10 විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- පශු සම්පත් අංශයේ යෝජිත ව්‍යාපෘති ලැයිස්තුව සකස් කිරීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම.

<u>වාරිමාර්ග හා ඉඩම්</u>

2015 වර්ෂයේ වාරිමාර්ග අංශය සඳහා රජයේ සමස්ත වියදම රු. බිලියන 50.27 ක් වූ අතර එම මුදලින් රු. බිලියන 44.58 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කරන ලදි. ජල සම්පත් සංවර්ධනය යටතේ කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීමට අපේක්ෂා කෙරෙන අතර ඒ යටතේ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, ගිං / නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය සහ කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතියන් හී ඉදිකිරීම් කටයුතු 2015 වර්ෂයේදි ද අඛණ්ඩව සිදු කරන ලදී. ඊට අමතරව වාරි අංශයේ පුනරුත්ථාපන ව්‍යාපෘති රැසක් සිදුකරන ලද අතර එමඟින් කෘෂිකර්මාන්තය සහ අනෙකුත් ජල අවශ්‍යතා සඳහා අවශ්‍ය ජලය ලබා දීම සුරක්ෂිත කෙරේ.

ඉඩම් අංශය සඳහා 2015 වර්ෂයේ රාජ්‍ය ආයෝජනය රුපියල් මිලියන 7,246 ක් වන අතර ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 3,006 ක් වැය කොට ඇත. රාජ්‍ය ආයෝජන අතර ඉඩම් හිමිකම් ඔප්පු වැඩසටහන (බිම් සවිය) - රු. මිලියන 413, රාජ්‍ය කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම - රු. මිලියන 2,045, උගත්පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම - රු.මිලියන 134 ඇතුළු අනෙකුත් සංවර්ධන වැඩසටහන් සඳහා රු. මිලියන 414 ක් ලෙස 2015 වර්ෂයේදී රාජ්‍ය ආයෝජන සිදුකොට ඇත.

## සිදුකරන ලද විශේෂ අධ්‍යයන

1. වාරි සහ ඉඩම් අංශයේ ක්‍රියාත්මක වෙමින් පවතින සහ අවසන් කරන ලද සංවර්ධන ව්‍යාපෘති වල වාර්තාවක් සකස් කර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

2. උතුරු හා නැගෙනහිර පළාත් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාල හා ඒකාබද්ධව උතුරු සහ නැගෙනහිර පළාත් සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීම සඳහා වාරි සහ ඉඩම් අංශයේ සංවර්ධන ව්‍යාපෘති ආතුළත් වාර්තාවක් පිළියෙල කිරීම.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අවසන් කරන ලද වාරි අංශයට අයත් කාර්යයන්**

1. වාරි හා ඉඩම් අංශයේ ව්‍යාපෘති වාර්තා 08ක් ඇගයීමට ලක් කොට, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ විදේශ සම්පත් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවලට ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම.

2. වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ඉඩම් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 05 කට අදාළ නිරීක්ෂණ සකස් කර අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කිරීම.

3. දේශගුණික විපර්යාස වලින් සිදුවන බලපෑම් අවම කිරීමේ වැඩසටහන යටතේ ගංඟාද්‍රෝණි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය යොමු කිරීමේ අනුදේශ පිළියෙල කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදීම.

4. දේශගුණික විපර්යාස වලින් සිදුවන බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය මගින් ආවරණය වන කාර්යයන් පුළුල් වීම නිසා අවශ්‍ය වූ අතිරේක මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය වාර්තාව සකස් කිරීමට තාක්ෂණික සහය ලබා දීම.

5. මොරකහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, වෙලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් කරන ව්‍යාපෘතිය, ඉරණමඩු වාරි සංවර්ධන ව්‍යාපෘතිය, දේශගුණික විපර්යාස වලින් සිදුවන බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සහ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන වැනි ප්‍රමුඛ වාරි සංවර්ධන වැඩසටහන් වල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සක්‍රීයව දායකවීම.

6. වාරි සහ ඉඩම් අංශයේ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගති සහ ප්‍රතිපත්ති සමාලෝචන කමිටු සඳහා සක්‍රීයව දායක වීම.

**<u>ධීවර :-</u>**

ශ්‍රී ලංකා ආර්ථිකයේ පුළුල් කිරීමට හැකියාවක් ඇති එක් ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස ධීවර අංශය සැලකෙන අතර එමඟින් 560,000 ක ජනතාව වෙනුවෙන් ඍජු හා වක්‍ර රැකියා අවස්ථා සැලසේ. මිලියන 2.6 ජනතාව සඳහා ජීවනෝපාය සැලසීම, ආදායම් උත්පාදනය, විදේශ විනිමය ඉපයීම සහ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම මඟින් මෙම අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ධීවර අංශය සඳහා 2015 වසරේ සමස්ථ රාජ්‍ය ආයෝජනය රු.මිලියන 6081 වේ. මූලධන වියදම් ලෙස රු.මිලියන 4497 ලබා දී ඇති අතර එය ප්‍රධාන වශයෙන් දිවයින පුරා ධීවර වරාය, නැංගුරම් පලවල් හා ගොඩබෑමේ ස්ථාන සංවර්ධනය, මිරිදිය හා ජලජීවී මත්ස්‍ය නිශ්පාදනය වැඩි දියුණු කිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම සඳහා භාවිතා කරන ලදී.

- උතුරු නැගෙනහිර සංවර්ධන සැලැස්ම සඳහා ධීවර අංශයේ වැඩසටහන් සකස් කිරීමට දායක වීම.
- ව්‍යාපෘති වාර්තා 25 විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 06ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ධීවර අංශයේ යෝජිත ව්‍යාපෘති ලැයිස්තුව සකස් කිරීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම.

## 3.2 <u>විදුලිබල හා බලශක්ති</u>

**<u>විදුලි බලය</u>**

ශ්‍රී ලංකාවෙහි මුළු විදුලි ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 3392 වන අතර මුළු විදුලි ජනනය ගිගාවොට් පැය 12,357 වේ. උපරිම විදුලිය සඳහා ඉල්ලුම මෙ.වො. 2,152 කි. ශ්‍රී ලංකාවෙහි විදුලි අවශ්‍යතාවය වසරකට සියයට 5 – 7 දක්වා ඉහළ ගිය අතර අනාගතයෙහි වාර්ෂික විදුලි ඉල්ලුම
4 – 6% වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින් සෑම වසරකම මෙගාවොට් 200ක අතිරේක ස්ථාපිත විදුලි ධාරිතාවයක් අවශ්‍ය වන අතර එය පිරිවැය අවම විදුලි ජනන ප්‍රභේද හරහා ලබා ගැනීමට අපේක්ෂිතය.

2. ශ්‍රී ලංකාවෙහි විදුලිය සඳහා ප්‍රවේශය සියයට 98% පමණ වන අතර, 2015/16 වර්ෂයන්හීදි 100% දක්වා ඉහළ නැංවීම රජයේ අපේක්ෂාවකි. එසේම පවුල් 270,000 ට විදුලිය ජාතික විදුලිබල පද්ධතිය හරහා හෝ වෙනත් මාර්ගයකින් ලබා දිය යුතුය.

3. සමස්ථ සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් හානිය 10.5% වූ අතර එය කලාපයෙහි අනෙක් රටවල් හා සසඳන කල අවම මට්ටමේ පවතී. තවද 2020 වන විට එය 8% දක්වා අවම කිරීමට අපේක්ෂිත ය.

## <u>ඛනිජතෙල් අංශය</u>

### <u>අනුගාමී ඛනිජතෙල් කාර්යය කර්මාන්තය</u>

**වර්තමාන තත්ත්වය**

රටෙහි වර්තමාන ඛනිජතෙල් අවශ්‍යතාවය දිනකට කිලෝබැරල් 100 වන අතර එය වාර්ෂිකව 5% ආසන්න ප්‍රමාණයකින් වර්ධනය වේ. රජය වාර්ෂිකව ඇ.ඩො.මිලියන 5000 – 5500 අතර ප්‍රමාණයක් ඛනිජතෙල් ආනයනය සඳහා වැය කෙරේ.

### <u>උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය</u>

**වර්තමාන තත්ත්වය**

මන්නාරම් ද්‍රෝනියෙහි සිදු කරන ලද පරිමාණ විශ්ලේෂණයෙහිදී, ශ්‍රී ලංකාවෙහි වාණිජමය වටිනාකමින් යුත් ස්වාභාවික වායු ඇති බවට අනාවරණය කොට ගෙන ඇති අතර, ඒවා අනාගත බලශක්ති අවශ්‍යතාවයන් සපුරා ගැනීමට යොදාගත හැකි බව විශ්වාස කෙරේ. එසේම මෙම දේශීය බලශක්ති ප්‍රභේද විශේෂයෙන්ම විදුලිය ජනනය සහ ප්‍රවාහන අංශ සඳහා යොදා ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වර්තමානයෙහි පවතින අභියෝග වනුයේ එම ගවේශන නිධියන් හී ආර්ථිකමය ශක්‍යතාවය විශ්ලේෂණය කොට, ඉල්ලුම, ආර්ථික සහ පාරිසරික තත්ව යටතේ දේශීය ගෑස් නිශ්පාදනයෙහි ආංශික බලපෑම හඳුනා ගැනීම සහ ප්‍රමාණාත්මක කිරීම වේ.

### <u>විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය මඟින් රටෙහි ආර්ථිකයට සිදු කරන ලද දායකත්වය 2015 තුල අනුමත කරන ලද ව්‍යාපෘතීන්</u>

1. මෙම කාල පරාසය තුල ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති 11ක් අනුමත කරන ලදී.

මීට අමතරව පහත සඳහන් කර්තව්‍යයන් සිදු කරන ලදී.

1. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 04ක් සඳහා ඍජු හා වක්‍ර නිරීක්ෂණ සැපයීම.
2. බලශක්ති ක්ෂේත්‍රයෙහි ව්‍යාපෘති සඳහා වන විදේශ දූත කටයුතු වලට අදාලව නිරීක්ෂණ සැපයීම.
3. ඛනිජතෙල් මිළ සූත්‍රය සෑදීමට දායක වීම.
4. බලශක්ති ක්ෂේත්‍රයට අදාල ගැටළු විශ්ලේෂණ පත්‍රිකා සහ සංකල්ප පත්‍රිකා සකස් කිරීම.

## 3.3 ආර්ථික යටිතල පහසුකම් , ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා ගුවන්සේවා

**මහා මාර්ග**

ආරක්ෂිත සහ පුළුල් ලෙස ව්‍යාප්ත වූ මාර්ග පද්ධතියක් තුළින් ගම්, නගර, ආර්ථික මධ්‍යස්ථාන එකිනෙක මනා ලෙස සම්බන්ධ කරමින් ආර්ථික වර්ධනයට අවශ්‍ය දායකත්වයක් ලබා දීමට හැකිවන පරිදි

මහාමාර්ග අංශය සංවර්ධනය කිරීම රජයේ ප්‍රතිපත්තිය වේ. මේ සඳහා ළඟා වීමේදී අභියෝග කිහිපයකට මුහුණ දීමට සිදුවන අතර රථවාහන ධාවනයේදී වේගවත් බව පවත්වා ගැනීම සහතික කිරීම, සීඝ්‍රයෙන් දියුණු වන නාගරික කේන්ද්‍ර සඳහා පිවිසුම් ලබා දීම, වැඩිවන රථවාහන සංඛ්‍යාවට අවශ්‍ය වන පරිදි මාර්ග පද්ධතියේ ධාරිතාවයන් ඉහළ නැංවීම, ඉහළ යන මගී හා භාණ්ඩ ප්‍රවාහන ඉල්ලුම සපුරාලීම, පටු සහ දුර්වල පාලම් මඟින් ඇතිවන අවහිරතා ඉවත් කිරීම, පදිකයින් සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් ලබා දීම, මාර්ග පද්ධතිය මනා ලෙස නඩත්තු කිරීම තුළින් එහි කල් පැවැත්ම තහවුරු කිරීම සහ මාර්ග අනතුරු අවම කිරීම එම අභියෝග අතර ප්‍රධාන වේ.

**ප්‍රවාහන**

පහළ මැදි ආදායම් ලබන ආර්ථිකයක් තුළ අඛණ්ඩව වර්ධනය වන ගොඩබිම් ප්‍රවාහන සේවා සඳහා වන ඉල්ලුම සපුරාලීම සඳහා, ප්‍රවාහන ක්ෂේත්‍රයේ ධාරිතාවය වර්ධනය කිරීම රජයේ අරමුණ වේ. ඒ අනුව ප්‍රවාහන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය, විශේෂයෙන් දුම්රිය ක්ෂේත්‍රයේ දුම්රිය මාර්ග, මැදිරි, එන්ජින් සහ දුම්රිය සංඥා යන අංශ සංවර්ධනය සහ ප්‍රවාහන අංශයේ විවිධ මාධ්‍යන් සම්බන්ධ කරමින් වැඩිදියුණු කළ ප්‍රවාහන පද්ධතියක් තහවුරු කිරීම උදෙසා අඛණ්ඩව ආයෝජනයන් සිදුකරන ලදී. මෙවැනි සංවර්ධන උපාය මාර්ග මඟින් ප්‍රවාහන අංශය මගීන්ගේ අවශ්‍යතා සඳහා ගැලපෙන, කාර්යක්ෂම සහ තරඟකාරී ක්ෂේත්‍රයක් ලෙස පරිවර්තනය කිරීමට අපේක්ෂා කෙරේ. එයට අමතරව, ප්‍රධාන පිවිසුම් මාර්ග ආශ්‍රිතව පවතින දැඩි රථවාහන තදබදය අවම කිරීම කෙරෙහිද අවධානය යොමුව ඇති අතර ඒ සඳහා මගීන් පෞද්ගලික වාහන භාවිතයෙන් ඉවත්කර පොදු ප්‍රවාහන සේවා භාවිතයට යොමු කරවීමට අරමුණු කෙරේ.

**වරාය**

2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවට පැමිණි නැව් සංඛ්‍යාවේ අඩු වීමක් පෙන්නුව ද 2015 වර්ෂයේදී මෙහෙයවන ලද බහාළුම් සංඛ්‍යාව මෙන්ම පැමිණි නැව් සංඛ්‍යාවේ ද දියුණු වීමක් පෙන්වීමට ශ්‍රී ලංකා වරාය හා නාවික අංශයට හැකි විය. වරාය විසින් මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 77.6 ක් ලෙස සියයට 4.3කින් ද මෙහෙයවන ලද බහාළුම් ඒකක ප්‍රමාණය (TEUs) මිලියන 5.6ක් ලෙස සියයට 5.3 කින් ද 2014 ට සාපේක්ෂව ඉහළ ගියේ ය.

**සිවිල් ගුවන් සේවා**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල ගුවන් මගීන්, ගුවන් භාණ්ඩ හා ගුවන් යානා හැසිරවීම සම්බන්ධයෙන් ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරයි. එය 2015 වර්ෂයේදී ගුවන් මගීන් මිලියන 8.5 හසුරුවා ඇති අතර එය 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 09ක වර්ධනයකි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල මඟින් ගුවන් යානා 58,729ක් හසුරුවීම සියයට 6 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර මුළු ගුවන් භාණ්ඩ මෙට්‍රික් ටොන් 215,032 ලෙස සියයට 12 ක වර්ධනයක් පෙන්නුම් කළේ ය.

**විශේෂිත වූ කාර්යයන්**

1. රේඛීය අමාත්‍යාංශය මඟින් යොමු කළ ඉහත විෂයන් වලට අදාල ව්‍යාපෘති යෝජනා සහ වැඩසටහන් 11 ක් ඇගයීම.

2. මහා මාර්ග, ප්‍රවාහන, ගුවන් හා වරාය යන අංශයන්ට අදාළ ආංශික ඉදිරි යෝජිත ව්‍යාපෘති ලැයිස්තුව සකස් කිරීම.

3. මහාමාර්ග, ප්‍රවාහන, ගුවන් හා වරාය යන අංශ වලට ප්‍රතිපත්ති හා සංවර්ධන උපාය මාර්ග සකස් කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.

4. ඉහත ක්ෂේත්‍රවලට අදාලව සංවර්ධන ප්‍රතිපත්ති ප්‍රකාශනය (කෙටුම්පත) සඳහා පරිච්ඡේද සකස් කිරීම.

5. ඉහත ක්ෂේත්‍රවලට අදාලව උතුරු සංවර්ධන හා නැගෙනහිර සංවර්ධන සැලසුම් සඳහා පරිච්ඡේද සකස් කිරීම.

6. 2015 - 2018 සඳහා රාජ්‍ය ආයෝජන සැලැස්ම (කෙටුම්පත) සකස් කිරීම.

7. මහා මාර්ග, ප්‍රවාහන, ගුවන් හා වරාය යන ක්ෂේත්‍ර වල පවතින කාලීන ගැටලු අධ්‍යනය කිරීම.

8. මහා මාර්ග, ප්‍රවාහන, ගුවන් හා වරාය යන ක්ෂේත්‍ර සඳහා යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 21 ක් සඳහා නිරීක්ෂන ලබා දීම.

9. ප්‍රගති සමාලෝචන කමිටු, මෙහෙයුම් කමිටු හා විදේශණය නියෝජිතායතන සමඟ වන රැස්වීම් 20 කට පමණ සහභාගී වීම.

## 3.4 නිවාස, නාගරික සංවර්ධන, ජල හා සනීපාරක්ෂක සහ පරිසර

<u>නිවාස හා නාගරික සංවර්ධනය</u>

මෙම අංශය නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය සහ මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා සම්බන්ධව කටයුතු කරනු ලබයි.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සඳහා 2015 වසර තුල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 08 ක් සඳහා නිරීක්ෂණ සපයා ඇති අතර ව්‍යාපෘති යෝජනා 13ක් ඇගයීමට ලක්කර ඇත. මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සඳහා 2015 වසර තුල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 06 ක් සඳහා නිරීක්ෂණ සපයා ඇති අතර ව්‍යාපෘති යෝජනා 22ක් ඇගයීමට ලක්කර ඇත.

**විශේෂ ක්‍රියාකාරකම්**

- නිවාස සහ නාගරික සංවර්ධනය සම්බන්ධයෙන් අනාගත සංවර්ධන ක්‍රමෝපායන් සහ වැඩපිළිවෙලවල් ඇතුලත් කරමින් සංකල්ප පත්‍රිකා සකස් කිරීම.

- රටේ දුප්පත් ජනතාවගේ ස්ථිර නිවාස අවශ්‍යතාවය සපුරාලීම අරමුණු කරගනිමින් "සැමට සෙවන" නිවාස වැඩසටහන දියත් කිරීමට දායකත්වය සැපයීම.

- නිවාස සහ නාගරික සංවර්ධන අංශ දෙකෙහි ඉදිරියෙදී ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යෝජනාවී ඇති ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති පෙළගැස්ම සකස් කිරීම.

- උතුරු සහ නැගෙනහිර පළාත් දෙකෙහි පසුගිය වසර කිහිපය තුල ක්‍රියාත්මක වූ, 2015 වසර තුල ක්‍රියාත්මක වෙමින් පවතින සහ ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත විශේෂ ව්‍යාපෘති මෙන්ම එම පළාත්හි පවතින සංවර්ධන අවශ්‍යතා පදනම් කරගනිමින් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් සකස්කරන ලද " උතුරු නැගෙනහිර සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා නිවාස සහ නාගරික සංවර්ධන අංශය තුලින් දායකත්වය සැපයීම.

- දේශීය ඉදිකිරීම් අංශය ඉහළ නංවාලීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිලිබඳ සාකච්ඡා කිරීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන සමග සාකච්ඡා මාලාවක් දියත් කිරීම.

**<u>ජල සම්පාදන :-</u>**

ජල පහසුකම්වල අවශ්‍යතාවය රටේ ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් පමණක්ම නොව එය රටේ සමාජ ආර්ථික වර්ධනය සඳහා ද අත්‍යවශ්‍ය අංගයක් වේ. එමනිසා, මෙම අංශය සඳහා වන රජයේ ප්‍රතිපත්තිය වන්නේ රටේ සියළු ජනතාවට පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව සඳහා සමානාත්මක ප්‍රවේශයක් ඇති කරලීමයි. එමඟින් ජනතාවගේ ජීවන තත්ත්වය මෙන්ම සමාජ ආර්ථික තත්ත්වය ද ඉහළ නැංවීමට අපේක්ෂා කරයි. තවද ගෘහස්ථ අංශය සඳහා අවශ්‍ය ජල පහසුකම් ඇති කිරීමත් සමඟම රටේ පවත්නා වාණිජමය හා කර්මාන්ත අංශයේ ජල ඉල්ලුම සපුරාලීමටද රජයේ අවධානය යොමු කර ඇත. ඒ අනුව, මෙම වසරේ මෙන්ම ඉදිරි වසරවල මධ්‍යකාලීන වශයෙන් මෙම අංශය තුළ සිදු කරනු ලබන ආයෝජනය මූලික වශයෙන් යොමු කරනුයේ රටේ ප්‍රාදේශීය වශයෙන් ජල පහසුකම්හි පවත්නා විෂමතාවයන් අවම කිරීම, CKD වැනි රෝග පැතිරයන ප්‍රදේශවලට වැඩි අවධානය යොමු කරමින් ඒ ප්‍රදේශ වෙත ජල පහසුකම් ලබා දීම, අඩු ජන ඝනත්වයක් පවතින ප්‍රදේශ වෙත ජල පහසුකම් ලබා දීමට ග්‍රාමීය ප්‍රජා ජලසම්පාදන ක්‍රම ශක්තිමත් කිරීම වෙනුවෙනි.

**<u>වර්ෂයතුළ සිදු කරන ලද ආංශිය කාර්යයන්:</u>**

- නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය හා අදාල අනෙකුත් ආයතන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 16ක මූලික අධ්‍යන කටයුතු සිදු කරන ලද අතර එයින් ව්‍යාපෘති යෝජනා 13ක් ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කරන ලද නිරීක්ෂණ වාර්තා, ජාතික අයවැය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තු වෙත යොමු කරන ලදී.

- නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 03කට අදාළ නිරීක්ෂණ ලබා දීම.

- රාජ්‍ය ආයෝජන වැඩසටහන (2015 - 2018) සඳහා ආංශික වැඩසටහනෙහි කෙටුම්පත් සකස් කිරීම.

- විදේශීය ණය නියෝජිතායතන විසින් ඉදිරිපත් කළ විදේශ ණය ගිවිසුම් සම්බන්ධයෙන් වන සටහන් (Aide Memoires) 10 කට පමණ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිරීක්ෂණ ලබා දීම.

- ප්‍රගති සමාලෝචන කමිටු, මෙහෙයුම් කමිටු හා විදේශ ණය නියෝජිතායතන සමඟ වන රැස්වීම් වැනි රැස්වීම් 30කට පමණ සහභාගී වීම.

- උතුරු නැගෙනහිර සංවර්ධන වැඩසටහන සඳහා ආංශික පරිච්ඡේදය සකස් කිරීම.

- ආංශික ඉදිරි යෝජිත ව්‍යාපෘති ලැයිස්තුව සකස් කිරීම (Project Pipeline).

<u>පරිසර</u>

ශක්තිමත් ආර්ථික වර්ධනයක් සඳහා අවශ්‍ය ආයෝජන සිදු කිරීමට කටයුතු කරන අතරතුරදී ම පාරිසරික ගුණාත්මක භාවය රැක ගනිමින් හා ස්වභාවික සංසිද්ධින් මෙන්ම මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වන ආපදාවන්හි බලපෑම් අවම කරමින් තිරසාර සංවර්ධනයක් ලඟා කර ගැනීම මෙම අංශයේ ජාතික ප්‍රතිපත්තිය වේ.

ජනගහන වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස ආහාර, ජලය, බලශක්තිය, ඉඩම් හා අනෙකුත් ස්වභාවික සම්පත් සඳහා වන ඉල්ලුම ශීඝ්‍ර ලෙස ඉහළ යාම හේතුවෙන් පරිසර හිතකාමී, තිරසාර සංවර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා වූ ලෝක අපේක්ෂාව මුදුන්පත් කර ගැනීම බලවත් අභියෝගයකට ලක්ව තිබේ. එමෙන්ම, පරිසර හායනයේ ප්‍රතිඵලයක් ලෙස බිහිව, වර්තමානයේදී පරිසර හායනයට හේතුකාරකයක් බවට පත්ව ඇති දේශගුණ වෙනස්වීම ද තවත් අභියෝග රැසක් එල්ල කරමින් සිටියි. මෙම දේශගුණ විපර්යාසයන්ගේ ඉහළ බලපෑම් තිරසාර සංවර්ධනයක් ලඟා කර ගැනීමේ අභිලාෂය කෙරෙහි අහිතකර ලෙස බල පවත්වයි. ඒ හේතුවෙන් දිළිඳුබව තුරන් කිරීම, තිරසාර, ස්ථායි ආර්ථික වර්ධනයක් පවත්වාගෙන යාම අභියෝගාත්මක වී තිබේ.

එබැවින්, සංවර්ධන ආර්ථික විද්‍යාවෙහිදී ඉතා වැදගත් නැගී එන අංශයක් ලෙස පරිසර ක්ෂේත්‍රය සැලකිය හැකි අතර අඩු කාබන් පරිභෝජනය, පිරිසිදු හරිත පරිසරයක් ස්ථාපිත කිරීම, පරිසර දූෂණය පාලනය කිරීම, ජෛව විවිධත්වය සහ පරිසර පද්ධතීන් සංරක්ෂණය කිරීම, පාරිසරික ආපදා අවම කිරීම, කාර්යක්ෂම සහ තිරසාර පරිභෝජන රටාවකට හැඩ ගැසීම තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම, සමාජ සාධාරණත්වය තහවුරු කිරීම සහ ස්වභාවික ආපදාවන්හි බලපෑම් අවම කරලීම මෙම අංශයේ අරමුණු වේ.

ඒ අනුව උක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම තුළින් පාරිසරික ප්‍රතිලාභ අත්පත් කර ගැනීම සඳහා, පරිසර අංශයේ මූලික ආයෝජන ප්‍රතිපත්ති වශයෙන්, පරිසර දූෂණය පාලනය , වන සංරක්ෂණය හා සංවර්ධනය,

තිරසර ඉඩම් කලමනාකරණය, වන සත්ත්ව - මිනිස් සහජීවනය, ජෛව සම්පත් සංරක්ෂණය සහ ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රවර්ධනය හඳුනා ගෙන ඇත.

පරිසර අංශය ලඟා කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රධාන ඉලක්ක කිහිපයක් පහත පරිදි වේ.

- 2018 වන විට කසල වලින් තොර, විධිමත් කසල කලමනාකරණයක් සහිත රටක් බිහි කිරීම.
- 2018 වන විට දිවයින වටා පිහිටි සමුදුර දූෂණයෙන් තොර කලාපයක් බවට පත් කිරීම.
- 2018 වන විට වන වැස්ම 29.7% සිට 32% දක්වා හෙක්ටයාර 60 කින් ඉහළ නැංවීම.
- මේ වන විට කි .මී .2,650 ක දිගින් යුතු අලි වැට ඉදි කොට ඇති අතර තවත් කි .මී .3,050 ක දිග ප්‍රමාණයක් ජෛව වැට ද සමඟ ඉදි කිරීම තුළින් 2025 වන විට අලි.මිනිස් ගැටුම තුරන් කිරීම-
- 2020 වන විට ආනයනය කරනු ලබන, විද්‍යුතයෙන් පමණක් ක්‍රියා කරන වාහන ප්‍රමාණයේ ප්‍රතිශතය 25%ක් දක්වා ඉහළ නැංවීම.
- 2020 වන විට ජාතික විදුලි සැපයුම් ජාලයට පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ලබා දෙනු ලබන දායකත්වය 20%ක් දක්වා ඉහළ නැංවීම.
- 2005-2015 ට සාපේක්ෂව 2030 වන විට ආපදා හේතුවෙන් සිදු වන මරණ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු කිරීම.
- 2018 වන විට කාලගුණ වාර්තාවන්ගේ නිරවද්‍යතාවය 70% සිට 72% දක්වා ඉහළ නැංවීම.
- 2018 වන විට නාය යෑම් හේතුවෙන් සිදු වන ජීවිත හානි වැළැක්වීම.
- 2018 වන විට ගංවතුර තත්ත්වයන්ගේ බලපෑමට ලක්වන ජන සංඛ්‍යාව 50%කින් පහළ දැමීම.

**විශේෂ අවස්ථා**

- පරිසර කළමනාකරණ අංශයට අදාළව රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 21 ක් ඇගයීමට ලක් කිරීම.
- රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 11 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- පරිසර කළමනාකරණ අංශයේ ව්‍යාපෘතීන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම.
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම .

## 3.5 කර්මාන්ත, වෙළඳ හා සංචාරක අංශය

මෙම අංශය කර්මාන්ත, වෙළඳ හා ආයෝජන, සංචාරක, කම්කරු හා විදේශ රැකියා යන උප අංශ පහෙන් සමන්විත වේ.

**කර්මාන්ත අංශය**

කර්මාන්ත අංශය ප්‍රධාන උප කොටස් තුනකින් එනම් කර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර යන අංශ වලින් සමන්විත වේ. ආර්ථික සංවර්ධනයේ හා තිරසාරභාවයේ නියමු ක්ෂේත්‍රයක් ලෙසට කර්මාන්ත ක්ෂේත්‍රය රජය විසින් හඳුනාගෙන ඇති බැවින් කර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර ශක්තිමත් කිරීම හරහා රටේ සමස්ත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මැදිහත්වීම් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලදි. රජයේ කර්මාන්ත ප්‍රතිපත්තිය අරමුණු කරනුයේ අපනයන ඉලක්ක කරගත්, භාණ්ඩ හා පිහිටීම අනුව විවිධාංගීකරණයක් සහිත කර්මාන්ත ඇති කිරීමට පෞද්ගලික අංශයට අවශ්‍ය පහසුකම් සැපයීමත්, සඵලදායී හා ඉහළ එකතු කළ අගයක් සහිත කාර්මීකරණයක් ඇති කිරීමය. එසේම පරිසර හිතකාමී, ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත වූ ගෝලීයව තරගකාරී කර්මාන්ත ක්ෂේත්‍රයක් නිර්මාණය කිරීමට අපේක්ෂිත ය. මෙම අරමුණු ලගා කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙමින් 2015 වසර තුළ පහත ක්‍රියාකාරකම් මෙම අංශය මගින් ඉටු කර ඇත.

**විශේෂ ක්‍රියාකාරකම්**

- කර්මාන්ත අංශය ආශ්‍රිත ව්‍යාපෘති වාර්තා 30ක් සඳහා නිර්දේශ ජාතික අයවැය දෙපාර්තෙම්න්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත ලබා දෙන ලදි.

- රේඛීය අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ 6 ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදි.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්ති රාමුව පිළියෙළ කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දෙන ලදි.

- සියළු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ආසියානු සංවර්ධන බැංකුව හා ඒකාබද්ධව ආර්ථික සංවර්ධන තීරයක් ඇති කිරීම (Economic Corridor Development) පිළිබඳව වැඩමුළුවක් පැවැත්වූ අතර ඒ සඳහා වූ අධ්‍යයනය සඳහා තාක්ෂණික සහය ලබා දෙන ලදි.

- කර්මාන්ත අංශයට අදාලව මෙරටට පැමිණෙන දූත මණ්ඩල සඳහා නිර්දේශ ලබා දුන් අතර ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව වැනි සංවර්ධන පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ආධාර සංදේශ (Aide Memorandum) සඳහා විස්තර සටහන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ඉදිරිපත් කරන ලදි.

## සංචාරක

සංචාරක කර්මාන්තය ආර්ථිකයේ 3 වන විශාලතම විදේශ විනිමය උත්පාදන මාර්ගය වේ. දළ දේශීය නිෂ්පාදනයට සංචාරක කර්මාන්තයේ දායකත්වය සියයට 3.5 ක් පමණ වේ. 2015 වසර අවසානයේදී සම්පූර්ණ සංචාරක ආගමනය මිලියන 1.79 ක් පමණ වන අතර සමස්ත විනිමය උත්පාදනය එ.ජ ඩොලර් බිලියන 2.92 ක් වේ. සංචාරක කර්මාන්තය ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන අතර රජය විසින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ කාර්යය ඉටුකරමින් සුදුසු වාතාවරණය සකස් කර දෙනු ලබයි. සංචාරක කර්මාන්තයට සම්බන්ධ පහත සඳහන් වැඩසටහන් 2015 වසර තුළදී ඉටු කරන ලදී.

- 2015 වසරේදී සංචාරක ප්‍රවර්ධන හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය විසින් යොමුකරන ලද ව්‍යාපෘති යෝජනා ගණන 2 ක් වේ . ඉන් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන 2 කි.

- 2015 වසරේදී අමාත්‍ය මණ්ඩල සංදේශ 1 කට නිරීක්ෂණ සපයන ලදී.

## කම්කරු සහ විදේශ රැකියා අංශය

කම්කරු සහ විදේශ රැකියා ප්‍රතිපත්තිය මඟින් ආර්ථික වර්ධනය සාක්ෂාත් කරගැනීම සඳහා අත්‍යවශ්‍ය වන සේවකයින්ගේ අයතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්දනය කිරීමට සහ යහපත් කාර්මික සබඳතාවයන් ඇති කරලීමට අපේක්ෂිතය. ඒ අනුව දැනට පවත්නා නීති රීති බලාත්මක කිරීමටත් ඉදිරියට මතුවිය හැකි තත්ත්වයන් සඳහා අවශ්‍ය වන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමටත් ඒවා අන්තර්ජාතික යහපත් ක්‍රියාමාර්ග හා සමගාමී කිරීමත් සිදුකළ යුතු වේ. මෙම අවශ්‍යතාවය හඳුනාගෙන 2015 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- ව්‍යාපෘති යෝජනා 3 ක් ඇගයීමට ලක් කරන ලදී.
- අමාත්‍ය මණ්ඩල සහ ආධාර පත්‍රිකා 3 කට නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- 2016-2018 රාජ්‍ය ආයෝජන වැඩසටහන, ආර්ථික සංවර්ධන සැලැස්ම සහ ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය සඳහා කම්කරු සහ විදේශ රැකියා අංශයට අදාල සටහන සහ ව්‍යාපෘති ලේඛනය සකස් කිරීම.
- නව ව්‍යාපෘති යෝජනා ලේඛනය යාවත්කාලීන කිරීම.
- සේවක අර්ථසාධක අරමුදල් සහ සේවා නියුක්ති භාරකාර අරමුදල් ගෙවීම් පැහැර හරින්නන් පිළිබඳව දත්ත එකතු කිරීම.
- එක්සත් ජාතීන්ගේ 70 වෙනි මහාමණ්ඩල සභාවාරයට ඉදිරිපත් කිරීම සඳහා අවිධිමත් සේවකයන් විධිමත් ආර්ථිකය තුලට ගෙන ඒමට ගෙන ඇති ජාතික ප්‍රයත්නයන් පිළිබඳව සටහනක් පිළියෙළ කිරීම.

## 3.6 සෞඛ්‍ය ,සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා හා ක්‍රීඩා,දේශීය වෛද්‍ය

**සෞඛ්‍ය**

රටකට ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා නිරෝගී ජාතියක් පැවතීම වැදගත් වේ. එහෙයින් ජාතික සෞඛ්‍ය සේවය සඳහා ඉහළ ආයෝජනයක් කිරීම, අවශ්‍ය ආයතනික හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ කිරීම තුලින් නිරෝගී ජාතියක් ගොඩ නැගීම රජයේ ප්‍රතිපත්තිය වේ. ඒ සඳහා 2015 වසර තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබිණි.

1. ව්‍යාපෘති යෝජනා 33ක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දී ඇති අතර අදාළ නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ ආයතන වෙත යොමු කර ඇත.

2. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 06ක් සඳහා නිරීක්ෂණ ලබා දී ඇත.

3. සෞඛ්‍ය අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය (Health Sector Development project) සැකසීම සඳහා අවශ්‍ය නිර්දේශ හා යෝජනා ලබා දී තිබේ.

4. ඉහල ආයෝජනයක් සහිත විදේශ මූල්‍ය පහසුකම් ලබා ගැනිම සඳහා යොමු කර ඇති සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිරීක්ෂණ ලබා දී ඇති අතර ලෝක සෞඛ්‍ය සංවිධානය, ලෝක බැංකුව, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය වැනි විදේශ මූල්‍ය ආයතන සමඟ ඒ සම්බන්ධයෙන් රැස්වීම් පවත්වා ඇත.

5. බෝ නොවන රෝග නිවාරණය හා පාලනය කිරීම සඳහා වන බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය නිරීක්ෂණ ලබා දී ඇත.

6. උතුරු හා නැගෙනහිර පළාත් වල සෞඛ්‍ය අංශයේ අවශ්‍යතාවයන් විශ්ලේෂණය කර එම පළාත් සඳහා සෞඛ්‍ය අංශයේ සංවර්ධනය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

**ආගමික, සංස්කෘතික, ජාතික උරුමයන් සහ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධ අංශය**

මෙම අංශය අමාත්‍යාංශ හතකින් සමන්විත වේ. එනම්, බුද්ධ ශාසන අමාත්‍යාංශය, පුනරුත්ථාපන නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය වශයෙනි. මෙම අමාත්‍යාංශ හත මගින් බුද්ධශාසන, හින්දු, ක්‍රිස්ත්‍රියානි සහ මුස්ලිම් යන ආගම් ද සංස්කෘතිය හා උරුමයන්, ජාතික ලේඛණාරක්ෂාව, ජාතික කෞතුකාගාරය, රාජ්‍ය භාෂා සහ සමාජ ඒකාබද්ධතාවය යන ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලැබේ.

**විශේෂ සිදුවීම්**

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා දෙකකට පිළිතුරු සැපයීම.
- 2015 වර්ෂය සඳහා ලැබුණු ව්‍යාපෘති වාර්තා 51 කට පිළිතුරු සැපයීම.
- ජාතික සංහිඳියාව, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ පවත්වන ලද උපදේශන කමිටු සඳහා සහභාගි වීම.

**ක්‍රීඩා අංශය**

පසුගිය වසර තුළ ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ආසියානු යොවුන් මලල ක්‍රීඩා තරගාවලිය, දෝහා අන්තර්ජාතික විවෘත බොක්සිං තරගාවලිය, ආසියානු ග්‍රෑන්ඩ් ප්‍රික්ස් තරගාවලිය, 5 වන පොදු මලල ක්‍රීඩා ශූරතා තරගාවලිය, 21 වන ආසියානු මලල ක්‍රීඩා ශූරතා තරගාවලිය, 8 වන පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල, තායිලන්ත කණිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතා තරගාවලිය, 25 වන අන්තර්ජාතික විවෘත කරාටේ ශූරතා තරගාවලිය, ආසියානු මලල ක්‍රීඩා ශූරතා තරගාවලිය, පොදු රාජ්‍ය මණ්ඩලීය බර ඉසිලීමේ ශූරතා තරගාවලිය, මැලේසියානු විවෘත මලල ක්‍රීඩා ශූරතා තරගාවලිය යනාදී අන්තර්ජාතික ක්‍රීඩා උළෙලවලදී පදක්කම් දිනා ගනිමින්, ක්‍රීඩා ක්ෂේත්‍රයේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගනු ලැබීය. ක්‍රීඩා අංශය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා රජයේ ආයෝජන යොදවනු ලැබිණි. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2015 වසර තුළදී පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලැබිණි.

- ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 4 ක් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කරනු ලැබූ අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අදාල ආයතන වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- ක්‍රීඩා හා සංචාරක කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සම්බන්ධ කරුණු වැඩිදුරටත් පැහැදිලි කරගැනීම සඳහා එම අමාත්‍යාංශය හා අදාල අනෙකුත් ආයතන සමග රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.

## 3.7 අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධනය තොරතුරු තාක්ෂණ විද්‍යා තාක්ෂණ

### අධ්‍යාපන

දැනුම පාදක කොටගත් ආර්ථිකයක අභියෝග ජය ගැනීමෙහිලා සමත් වන, දැනුමෙන් පමණක් නොව කුසලතා, දක්ෂතා, ගුණධර්ම, ආකල්ප වලින් පරිපූර්ණ සමබර පුද්ගලයන් බිහිකිරීම පාසැල් අධ්‍යාපන පද්ධතියේ අරමුණ වේ. ඒ අනුව, දැනුම පාදක කොටගත් ආර්ථිකයක් ඇති කිරීමේ දැක්මට අනුකූලව යමින්, 2015 වසරේදී අධ්‍යාපන අංශය සුවිශේෂී ජයග්‍රහණ අත් පත් කර ගැනීමට සමත් විය.

වසර 13 ක අනිවාර්ය අධ්‍යාපනය, පාසැල් මණ්ඩල ස්ථාපනය කිරීම, ගුරුවරුන් බඳවාගැනීම හා කළමනාකරණය ඇතුළු අධ්‍යාපන ප්‍රතිපත්ති සංශෝධන පිළිබඳ මූලික සාකච්ඡා වසර 2015 තුළ ආරම්භ කරන ලදී. ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම, ඉ-අධ්‍යාපනය වැනි අන්තර් ක්‍රියාකාරී ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ ප්‍රවර්ධනය කිරීම පිළිබඳව සුවිශේෂී ප්‍රයත්න දරමින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා ප්‍රමුඛ අවධානයක් යොමු කෙරිණ.

**2015 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්**

- අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ පැවති අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි මග පිළිබඳ සාකච්ඡා කිරීමේ රැස්වීම් සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.
- අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP), දැනුම් සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය (TSEP) යන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සහ මෙරටට පැමිණෙන නියෝජිත කණ්ඩායම් සඳහා රැස්වීම් සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීම.
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම තවදුරටත් පුළුල් කිරීම සඳහා වන "ජාතික ඉ-ඉගෙනුම් පද්ධතිය ද ඇතුළුව සාමාන්‍ය අධ්‍යාපනය සඳහා පරිපූර්ණ තොරතුරු තාක්ෂණ ක්‍රමෝපායක් ස්ථාපනය කිරීම සඳහා පළාත් හා කලාප මට්ටමින් තොරතුරු තාක්ෂණ කේන්ද්‍රස්ථාන ස්ථාපනය කිරීම" ව්‍යාපෘතිය හා සම්බන්ධ වැඩමුළු හා රැස්වීම්වලට සහභාගී වීම.
- වතු පාසැල් සංවර්ධනය පිළිබඳව පැවති දින 100 ක්‍රියාකාරකම ක්‍රියාවට නැංවීම සඳහා පහසුකම් සැලසීම.
- අමාත්‍යාංශයෙන් සහ අදාළ ආයතනයන් ගෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2017-2019 පිළියෙළ කිරීම සඳහා මූලික සාකච්ඡා හා රැස්වීම් පැවැත්වීම.
- උතුරු හා නැගෙනහිර පළාත්වල පාසැල්වල අවශ්‍යතා පිළිබඳ වාර්තාවක් පිළියෙළ කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 08 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් 42 ක් ඇගයීම.

## උසස් අධ්‍යාපන

රාජ්‍ය විශ්වවිද්‍යාල 17 ක් පශ්චාත් උපාධි ආයතන 7 ක් සහ අනෙකුත් උපාධි ලබාදෙන ආයතන 9 ක් මඟින් රජය උසස් අධ්‍යාපන අවශ්‍යතා සපයනු ලැබේ. වර්තමානයේදී, උසස් අධ්‍යාපන ආයතන තුල ප්‍රථම උපාධි හා පශචාත් උපාධි අපේක්ෂකයන් 108,000 ක්, අධ්‍යයන කාර්යමණ්ඩලය 5610 ක් සහ අනෙකුත් කාර්යමණ්ඩල සාමාජිකයින් 11953 ක් දෙපාර්තමේන්තු 86 ක් තුල සේවය කරයි. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය උසස් අධ්‍යාපන අවකාශ සැපයීමෙහි ප්‍රමුඛ කාර්යයක් ඉටු කරන අතර, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ප්‍රවර්ධනය කිරීම තුලින් උසස් අධ්‍යාපන අවකාශයන් පුළුල් කිරීම සහ තරගකාරිත්වයක් ඇතිකිරීමේ අවකාශය සැලසේ.

අප රට තුල උසස් අධ්‍යාපනය හැදෑරීමේ අවකාශය ලැබෙනුයේ සීමිත පිරිසකට පමණක් වන අතර ඔවුන්ව රැකියා වෙළඳපොළ අවශ්‍යතාවයන්ට සරිලන, දක්ෂ උපාධිධාරීන් බවට පත්කිරීම ප්‍රධාන වගකීමක් වේ. එමගින් ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම හා රටෙහි ජාතික තාක්ෂණ පර්යේෂණ හා නවෝත්පාදන කිරීම තුළින් ආර්ථික වර්ධනය සඳහා සෘජුවම උපාධිධාරීන් සම්බන්ධ වෙනු ඇත. එම අරමුණු සපුරා ගැනීම සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදුකරන ආයෝජන කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීම අවශ්‍ය වේ.

### 2015 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ පැවති උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි මග පිළිබඳ සාකච්ඡා කිරීමේ රැස්වීම් සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ පැවති තාක්ෂණික විෂය ධාරාව හදාරන සිසුන් විශ්ව විද්‍යාලවලට ඇතුළත් කිරීම පිළිබඳ රැස්වීම් සඳහා සහභාගී වීම.
- විශ්වවිද්‍යාල නගර සංවර්ධන වැඩසටහන් ආදී වැඩසටහන් හා ව්‍යාපෘති නිර්මාණය කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට සහාය දැක්වීම සහ එම ව්‍යාපෘති යෝජනා සැකසීම සඳහා අදාළ පාර්ශ්වයන් සමග විශේෂ රැස්වීම් සංවිධානය කිරීම.
- උසස් අධ්‍යාපන අංශයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක කෙරෙන විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපනය වැනි ව්‍යාපෘති පිළිබඳව මෙරටට පැමිණෙන නියෝජික කණ්ඩායම් සඳහා රැස්වීම් සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීම.
- උසස් අමාත්‍යාංශයෙන් සහ අදාළ ආයතනයන්ගෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.

- උසස් අධ්‍යාපන යන අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 3ක් සහ ප්‍රතිපත්ති සම්බන්ධ පත්‍රිකා සඳහා නිරීක්ෂණ සැපයීම.

- උසස් අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් 16 ක් ඇගයීම.

<u>නිපුණතා අධ්‍යාපන අංශය</u>

රටෙහි තිරසාර ආර්ථික සංවර්ධනයක් සඳහා ඉහළ නිපුණතාවයකින් යුත් ශ්‍රමබලකායක් සිටීම අවශ්‍ය වේ. එබැවින් වසර 2020 වන විට ජාතික වෘත්තීය සුදුසුකම් සහිත 175,000 ක්ද ඇතුළුව වසරකට විවිධ ක්ෂේත්‍රයන්ට අදාල නිපුණතා සහිත තරුණ, තරුණියන් 250,000 ක් බිහිකිරීම අරමුණු කර ඇත. මෙහිදී හැකියාවන්, මෘදු කුසලතාවයන් වැඩිදියුණු කිරීමත් වෘත්තීය පුහුණු පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ ගුණාත්මක වෘත්තීය පුහුණුවකට ඇති ප්‍රවේශය ශක්තිමත් කිරීමත් තුලින් ගෝලීය ආර්ථිකය තුළ සේවා නියුක්ත විය හැකි ශ්‍රී ලාංකිකයෙකු බිහිකිරීම මූලික ප්‍රතිපත්තිය වේ.

**2015 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්**

- ව්‍යාපෘති වාර්තා 34ක් ඇගයීමට ලැබුණු අතර ඉන් 15ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබේ. ඉතිරි ව්‍යාපෘති වාර්තා සඳහා පැහැදිලි කිරීම් සහ වෙනස්කිරීම් ඉදිරිපත් කරන ලෙස අදාල ආයතන වෙත දැනුම් දී ඇත. ඊට අදාල නිරීක්ෂණ එකී ආයතන, විදෙස් සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ.

- ව්‍යාපෘති සැකසීමට අදාල ගැටළු හා ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරන විට අන්තර් ගත කල යුතු කරුණු හා ඒවා ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ රාජ්‍ය අංශයේ විවිධ අමාත්‍යාංශ යටතේ ඇති විවිධ නිපුණතා සංවර්ධන ආයතන සමඟ හා සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වා දැනුවත් කිරීම.

- තවද, වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වන සංඛ්‍යාව ඉහළ නැංවීම සම්බන්ධවත් එහිදී පාසැල් හැරයන්නන් වෘත්තීය පුහුණු අංශය කරා යොමු කරවා ගැනීම සම්බන්ධවත් වැඩි ප්‍රමුඛතාවයක් ලබා දෙන ලදි. එබැවින් ශිෂ්‍ය භට බලකාය, නිපුණතා හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය, යොවුන් සේනාංකය යන ත්‍රිත්වයේ එකතුවෙන් ක්‍රියාත්මක වන පරිදි ජාතික තරුණ සංවර්ධන වැඩසටහන සකස් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීම.

- සකසන ලද ජාතික තරුණ සංවර්ධන වැඩසටහන අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය වෙත පිලිගැන්වීම.

- ජාතික මානව සම්පත් සහ සේවා නියුක්ති ප්‍රතිපත්තිය පිළිබඳ සැලැස්ම සැකසීමට අදාල ගැටළුකාරි අංශයන් විසඳා ගැනීම සඳහා ඔවුන්ට පහසුකම් සපයන්නෙකු ලෙස සහාය වීම.

- උතුරු නැගෙනහිර සංවර්ධන සැලැස්ම යටතේ නිපුණතා හා වෘත්තීය පුහුණු අංශයේ ඇති අඩුපාඩු හා සංවර්ධනය විය යුතු අංශයන් පිළිබඳ වාර්තාව සැකසීම.

- රාජ්‍ය ආයෝජන සැලැස්ම යටතේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අංශයේ ඉදිරි සැලසුම් හා ආයෝජන ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම හා ලැයිස්තුගත කිරීම.

<u>**තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන**</u>

තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, තැපැල් හා විදුලි සංදේශ යන අංශවලින් තොරතුරු හා සන්නිවේදන අංශය සමන්විත වේ. තොරතුරු තාක්ෂණ සම්බන්ධ සේවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර බාහිරකරණ (ICT/BPO) සහ දැනුම් බාහිරකරණ (ICT/KPO) යන ආදායම් උපයන කර්මාන්ත තොරතුරු තාක්ෂණ අංශයට ඇතුළත්ය.

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය දැනුම පාදක කරගත් සේවා අංශයක් ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. මෙම අංශය තුළ තොරතුරු හා සන්නිවේදන පහසුකම් ඉහළ නැංවීම, තොරතුරු හා සන්නිවේදන මාධ්‍ය වෙත ළඟාවීම පහසු කිරීම, ඉ-රාජ්‍ය සේවා ප්‍රවර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට වැදගත්වන නීතිමය පසුබිම සැකසීම යන කරුණු කෙරෙහි රජය මූලික අවධානය යොමු කරන අතර පද්ධති වැඩිදියුණු කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් සේවා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම තුළ පෞද්ගලික අංශය අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 17 ක් ඇගයීමට ලක්කර ඇත.
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනය (Project Pipeline) සකස් කිරීම.
- ප්‍රමුඛතා අංශ පාදක කර ගනිමින් කාල සහ ප්‍රතිඵල දර්ශක සකස් කිරීම.
- විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ, තැපැල් හා ජනමාධ්‍ය අංශවල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 07 කට නිරීක්ෂණ සපයා ඇත.
- 2014 වාර්ෂික වාර්තාව සඳහා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශයෙහි උප පරිච්ඡේදය සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීමේදී රේඛීය අමාත්‍යාංශ සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම.

**<u>තාක්ෂණ හා පර්යේෂණ</u>**

තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රය ලෝක මට්ටමට ගෙන යාම රජයේ ප්‍රධාන අරමුණක් වේ. රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි ඉහළ තාක්ෂණික කර්මාන්ත ක්ෂේත්‍රය විශාල දායකත්වයක් දක්වනු ලබයි. ඉහළ තාක්ෂණික කර්මාන්ත ප්‍රවර්ධනය තුලින් දේශීය කර්මාන්තවල ගුණාත්මකභාවය, ඵලදායීතාවය හා තරඟකාරිත්වය වැඩි කිරීමට රජය විසින් දැනටමත් අවශ්‍ය පියවර ගෙන ඇත. පසුගිය වසර කිහිපයේදී සිදුකරන ලද නැනෝතාක්ෂණය, ජෛව තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන්හී පර්යේෂණ තුලින් ආහාර සැකසීම, පටක විද්‍යාව හා පොහොර යන අංශයන්හී ප්‍රවර්ධනයක් පෙන්වා ඇත.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 5 ක් ඇගයීමට ලක්කර ඇත.
- තාක්ෂණ හා පර්යේෂණ අංශය සඳහා ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනය (Project Pipeline) සකස් කිරීම.
- තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 7 කට නිරීක්ෂණ සපයා ඇත.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයයේ 2014 වාර්ෂික වාර්තාව සඳහා තාක්ෂණ හා පර්යේෂණ අංශයෙහි උප පරිච්ඡේදය සැකසීම සඳහා තොරතුරු ලබා දීම.
- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීමේදී රේඛීය අමාත්‍යාංශ සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම.

## 3.8 සාර්ව ආර්ථික

**සාර්ව ආර්ථික**

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම, පවත්නා සාර්ව ආර්ථික ප්‍රශ්න හා ගැටළු හඳුනා ගැනීම, සමාලෝචනය හා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සාර්ව ආර්ථික සැලසුම් අංශයේ වගකීම වේ. මෙම අංශය මගින් දළ ජාතික නිෂ්පාදනය, උද්ධමනය හා ගෙවුම් ශේෂය ආදි සාර්ව ආර්ථික විචල්‍යයන් හා බැඳුණු කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- සාර්ව ආර්ථික රාමුව සැකසීම.
- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා හතරක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ආයෝජන වැඩසටහනෙහි (2016 - 2018), ආර්ථික සංවර්ධන සැලැස්මෙහි හා ජාතික සංවර්ධන ප්‍රතිපත්තියෙහි සාර්ව ආර්ථික පරිච්ඡේදය සැකසීම.

- සාර්ව ආර්ථිකය හා සම්බන්ධ උපදේශන පත්‍රිකා (Aid Memos) හතරක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

- සංවර්ධන ප්‍රතිපත්ති ණය සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

- දකුණු ආසියාවේ දේශසීමා හරහා සිදුවන නාවික ගමනාගමනය (Cross-border Maritime Traffic in South Asia) පිළිබඳ වූ සම්මන්ත්‍රණයෙහි ප්‍රධාන කථාව පිළියෙළ කිරීම.

- සංවර්ධන සහයෝගීතා ආයතන සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

## 3.9 ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ අංශය

### සමාජ ආරක්ෂණ අංශය

සමාජ ආරක්ෂණ අංශය කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, සමාජ සවිබලගන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙමින් කටයුතු සිදු කරනු ලැබේ. මෙම අංශය සඳහා 2015 වසරේ සමස්ථ රාජ්‍ය ආයෝජනය - රු. මිලියන 1,525 කි. මෙහිදී ආබාධිත පුද්ගලයන් හා වැඩිහිටි පුද්ගලයන් සඳහා ලබා දෙනු ලබන දීමනාවන් විශේෂ තැනක් ගනී.

ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රජා විද්‍යාත්මක හා සමාජීය මානයන් සංවර්ධනයත් සමඟ කැපී පෙනෙන ලෙස වෙනස් වෙමින් පවතී. මෙම වෙනස් වීම නිසා ළමුන්, වරප්‍රසාද නොලත් කාන්තාවන්, වැඩිහිටියන්, ආබාධිතයින් වැනි ජනගහනයේ ඇතැම් කණ්ඩායම් වල පීඩාවට ලක් වීමේ හැකියාවන් වර්ධනය කළ ද, විශේෂිත මැදිහත් වීම් හරහා මෙම කණ්ඩායම් වල ජීවන තත්ත්වය නඟා සිටුවීමට හා ඔවුන් සමාජ ප්‍රවාහයට එක් කිරීම උදෙසා පවුලේ සුභසාධනය නංවාලීමට ඉහත අමාත්‍යාංශය සමඟ එක් වී අවශ්‍ය ප්‍රතිපත්තිමය හා වැඩසටහන් සකස් කිරීම සඳහා දායකත්වය ලබා දෙන ලදී.

<u>විශේෂ ක්‍රියාකාරකම්</u>

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 11 කට හා ව්‍යාපෘති යෝජනා 11 සඳහා අවශ්‍ය නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
- 2013 මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ අදාල අංශයන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සපයන ලදී.
- සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම.
- ජාතික පූර්ව ළමා සංවර්ධන වැඩසටහන "National Early Children Development Programme 2015 – 2020" සකස් කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ගික සැලැස්ම (Strategic Frame Work) සකස් කිරීම.

- අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු විසින් මෙහෙයවන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

**<u>ප්‍රාදේශීය සංවර්ධනය</u>**

පවත්නා ප්‍රාදේශීය විභවතාවත්, සුවිශේෂතා හා විවිධතා හඳුනාගනිමින් සෑම ප්‍රජාවකගේම ජීවන තත්ත්වයක් ඉහළ මට්ටමකට දියුණු කිරීම ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ජාතික ප්‍රතිපත්තිය වේ.

ජාතික මට්ටමේ සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනිම සඳහා ඒ ඒ පළාත්වල පවතින සම්පත් ප්‍රශස්ත හා තිරසාර මට්ටමින් භාවිතයට ගැනිමේ වැදගත්කම මෙම අංශය මඟින් අවධාරණය කෙරේ. ආර්ථික වර්ධන වේගය, මානව සංවර්ධන දත්ත, සමාජ දත්ත හා ඒවායේ කාලීන වෙනස්කම් විශ්ලේෂණය කිරිමේදී පළාත් 9 තුළ පවතින මූලික සංවර්ධන ගැටළු, විෂමතාවන් හා අභියෝගයන් පිළිබඳව අනාවරණය වේ. ඒවා අතුරින් ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවන් කෙරෙහි අවධානය යොමු කිරිම ඉතා වැදගත්වන අතර එය අදාළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය, මානව සංවර්ධන දර්ශකය, කාර්මීකරණ මට්ටම, කෘෂිකාර්මික හා යටිතල පහසුකම් සංවර්ධන මට්ටම යන කාරණා සමඟ සමීපව බැඳී පවතී. ප්‍රාදේශීය සංවර්ධන විෂමතා අවම කිරීම පිළිබඳව නිදහසින් පසු සියළුම පාලන තන්ත්‍රයන් හී අවධානය යොමු වී ඇත.

කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් සංවර්ධන කමිටු පිහිටුවීම, පළාත් සභා හා පලාත් පාලන ක්‍රමය ස්ථාපිත කිරිම, ගම් උදාව වැඩසටහන, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිම, ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන දියත් කිරිම, ගම නැගුම හා පුරනැගුම වැඩසටහන් ක්‍රියාත්මක කිරිම ප්‍රාදේශිය සංවර්ධන විෂමතා අවම කිරීම ඉලක්ක කරගත් වැඩසටහන් කිහිපයකී. ප්‍රාදේශීය සංවර්ධන අංශය අනෙකුත් අංශ ගණනාවක් සමඟ සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වන බැවින් එකී අංශ මඟින් ක්‍රියාත්මක කරන වැඩසටහන් ද ප්‍රාදේශීය සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා වැදගත් වේ.

**මැදි කාලීන ඉලක්ක:**

- වසර 2020 වනවිට නැගෙනහිර හා ඌව පළාත් වල පවත්නා දුගීකම ජාතික මට්ටමේ අගය දක්ත අවම කිරීම.

- වසර 2020 වනවිට වෘත්තීය පුහුණු හා තාක්ෂණික අධ්‍යාපනය සඳහා බඳවාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව දැනට පවතින මට්ටමට වඩා 50% න් ඉහළ නැංවීම.

- මධ්‍යම පළාත, උතුරු හා උතුරු මැද පළාත්වල පවතින මාතෘ මරණ අනුපාතිකය වසර 2020 වනවිට ජාතික අගය දක්වා අවම කිරීම.

- මධ්‍යම, උතුරු හා වයඹ පළාත්වල පවතින ළදරු මරණ අනුපාතිකය වසර 2020 වනවිට ජාතික මට්ටම දක්වා අවම කිරිම.

- වසර 2020 වනවිට නාගරික අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස 100,000 ක් ඉදිකිරීම.

- වතු ප්‍රජාව සඳහා මූලික පහසුකම් සහිත නිවාස ඒකක 65% ක් 2020 වනවිට ලබා දීම.

- පූර්ණ කාලීන නව ව්‍යවසායකයන් 150,000 ක් සියළුම පළාත් ආවරණය වනපරිදි ඇති කිරීම හා ස්වයං රැකියා තුළින් පවුල් 350,000 කට අමතර ආදායම් උත්පාදන ක්‍රමෝපායන් ඇති කිරීම.

- ප්‍රමුඛතාවයන් පදනම් කරගෙන 50% කට වැඩි කුඩා හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග ක්‍රම පුනරුත්ථාපනය කිරීම.

**විශේෂ අවස්ථා**

- අදාළ රේඛීය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ දෙකක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

- අදාළ රේඛීය අමාත්‍යාංශ මඟින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා දෙකක් ඇගයීමට ලක් කිරීම.

- මැදි හා දිගුකාලීන ඉලක්ක ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබාදීම.

## 3.10 රාජ්‍ය කළමනාකරණය

කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය සේවය තුළ ආයතනික, මානව සහ සේවා සැපයීමේ ඵලදායිත්වය යන අංශයන්හි ක්‍රමික වර්ධනයක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ . පෞද්ගලික අංශය සංවර්ධන කාර්යයේ යෙදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම අරමුණු කර ගෙන රාජ්‍ය අංශය කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටුකරනු ලබයි .මේ නිසා ඵලදායි හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය අංශයේ මානව හා ප්‍රාග්ධන යන දෙකෙහිම ධාරිතා වර්ධනය ඉතා වැදගත් වේ. එම නිසා පසුගිය වසර තුළ රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව පහත සඳහන් පරිදි දායක වී ඇත.

- ව්‍යාපෘති යෝජනා 17 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇති අතර නිර්දේශ කිරිමේ ලිපි විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යවන ලදී.
- රාජ්‍ය කළමනාකරණ අංශයට අයත් විවිධ අමාත්‍යාංශ වලින් ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ 20 ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදි.
- අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් මෙහෙය වන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා එම ආයතන වල වර්ධනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යංශය. නීතිය හා සාමය අමාත්‍යාංශය , අධිකරණ අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යංශය යන අමාත්‍යාංශ වල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ හා යෝජනා ලබා දීම.

- රාජ්‍ය ආයෝජන සැලැස්මෙහි  රාජ්‍ය පාලන අංශයට අදාල මූලික කටයුතු සිදුකිරීම.
- උතුරු නැගෙනහිර සංවර්ධන වැඩසටහන සඳහා ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීම.
- ශ්‍රී ලංකාවේ වාණිජ නඩු විසඳීම කඩිනම් කිරීම සඳහා වැඩසටහනක් යෝජනා කිරීම.
- ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත සහාය ලබාදීම.

## 4. සංවර්ධන තොරතුරුමධ්‍යස්ථානය

සංවර්ධන තොරතුරු මධ්‍යයස්ථානය ආර්ථික සංවර්ධනය හා සැලසුම්කරණයට සහ ආශ්‍රිත විෂයන්ට අදාලව පොත්පත් හා තොරතුරු සැපයීමේ විශේෂිත පුස්තකාලයක් ලෙස ක්‍රියා කරයි. මුදල් අමාත්‍යාංශය සහ ප්‍රතිපත්ති සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල නිලධාරීන්ට තොරතුරු අවශ්‍යතා සපුරාලන පුස්තකාලයක් ලෙස සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය හඳුන්වා දිය හැකිය. එසේම තොරතුරු සොයා පැමිණෙන විශ්ව විද්‍යාල සිසුන්ට පර්යේෂකයන්ට මෙම ආයතනයේ සේවාව ලබා ගත හැකිය. තවද සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය සාක් රටවල තොරතුරු කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙසද කටයුතු කරයි.

**පුස්තකාල සංවිධානය**

- පිටතින් ලැබෙන සියළුම පොත්පත්, ලිපි ලේඛන පුස්තකාලයට අත්කර ගැනීම සහ පරිශීලනයට පහසු වන ලෙස වර්ග කිරීම.
- සඟරා අංශය වැඩි දියුණු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ පහසුව සඳහා ලිපි ලේඛන ක්‍රමවත්ව සැකසීම.
  පොත් එකතුව නැවත ක්‍රමානුකූලව සැකසීම.

**බෙදාහැරීම්, විමසීම් හා විමර්ශනෂණය**

- තොරතුරු අවශ්‍යතා විමසීම ගැන කටයුතු කිරිම.
- පරිගණක දත්ත උපයෝගි කරගෙන තොරතුරු ගවේශන සැකසීම.
- තොරතුරු ප්‍රවර්ධනය සඳහා පරිගණක භාවිතා කොට බෙදා හැරීමට කටයුතු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ අවශ්‍යතාවය අනුව පුවත්පත්, ලිපි, සඟරා සුපරීක්ෂණය කිරීම.

**අනෙකුත් සේවාවන්**

- තොරතුරු ලබා ගැනීම සඳහා විවිධ අන්තර්ජාල සමඟ සම්බන්ධ වීම.
  උදා. INSAP, E library USA
- පුවත් තොරතුරු ලබා දීමේ සේවය
- වාර සඟරා ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- සම්මත ක්‍රියාපටිපාටීන් අනුගමනය කරමින් ජාතික පුස්තකාලය සහ ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලද පුස්තකාල ජාලයන් හී විවිධ කාර්යයන්ට දායක වීම.
- අන්තර් පුස්තකාල හුවමාරු ක්‍රමය පවත්වාගෙන යාම.

- ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ජාලය සමඟ දිගටම සබඳතා පවත්වා ගැනීම.

## 5. මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය

**2015.12.31 දිනට කාර්ය මණ්ඩලය**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | එස්.එස්.මුදලිගේ මයා | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | එම්.ගංගාදරන් මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 03 | එස් .ඩී .රත්නායක මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 04 | කේ.ඩී.එස්.ආර්.පෙරේරා මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 05 | එන්.විජේවීර මිය | අධ්‍යක්ෂ (මුදල්) |
| 06 | යූ.එන්.මල්ලවාරච්චි මයා | අධ්‍යක්ෂ |
| 07 | සී.සේනානායක මිය | අධ්‍යක්ෂ |
| 08 | ටී.ඒ.ඩී.ඩී.ප්‍රේමරත්න මයා | අධ්‍යක්ෂ |
| 09 | ටී.එම්.ජේ.බණ්ඩාර මයා | අධ්‍යක්ෂ |
| 10 | එම්.එෆ්.මුබාරක් මයා | අධ්‍යක්ෂ |
| 11 | ටී. ප්‍රශාන්ත් මිය | අධ්‍යක්ෂ |
| 12 | ඒ.ආර්.වික්‍රමරත්න මයා | අධ්‍යක්ෂ |
| 13 | ඒ.කේ. ගුණසේකර මයා | අධ්‍යක්ෂ |
| 14 | පී.එච්.චන්දිමා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 15 | ඩී.පී.නිහරේපොල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 16 | පී.එම්.එස්.ජයතිලක මයා | සහකාර අධ්‍යක්ෂ |
| 17 | කේ.එන්.පී.ජයරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 18 | ටී.එම්.ඩී.පී.තෙන්නකෝන් මයා | සහකාර අධ්‍යක්ෂ |
| 19 | ඩබ්.එල්.පී .ප්‍රනාන්දු මිය | සහකාර අධ්‍යක්ෂ |
| 20 | ආර්.කේ.එල් ජාගොඩ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 21 | ටී.වයි.එල්.මුණසිංහ මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 22 | ආර්.ඩී.ඒ.මෛත්‍රීරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 23 | ජී.ආර්.සී.හේවාවසම් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 24 | එම්.ඒ.ජී.තුෂාරි මිය | සහකාර අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| 25 | ඩී.ඒ.සී.ඩී.පීරිස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 26 | ඩබ්.ඒ.ජේ.සී.වික්‍රමාරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 27 | ඩී.ඒ.මනෝරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 28 | ඩබ්.ඒ.වල්පිට මිය | සහකාර අධ්‍යක්ෂ |
| 29 | ඩී.එච්.ආර්.ඩී.විජේවර්ධන මිය | සහකාර අධ්‍යක්ෂ |
| 30 | කේ.ජී.ආර්.ජී.ආර්.වික්‍රමවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 31 | ආර්.එච්.සී.කේ.රාමසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 32 | එච්.ඩී.එන්.කේ. හෙට්ටිආරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 33 | කේ.බී.එස්.එස්.ප්‍රනාන්දු මයා | සහකාර අධ්‍යක්ෂ |
| 34 | එම්.ඒ.එස්.දබරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 35 | එල්.එච්.එම්.ආර්.බී.ලංසකාර මයා | සහකාර අධ්‍යක්ෂ |
| 36 | එස්.එම්.ඩී.ඩී.සමරකෝන් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 37 | යූ.ඒ.ඩබ්.එල්.සුමනසේකර මිය | සහකාර අධ්‍යක්ෂ |
| 38 | කේ.ඩී.සී.තාමරසී මිය | සහකාර අධ්‍යක්ෂ |
| 39 | ඩබ්.එම්.හංසනී මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 40 | එම්.ජී.පී.කේ.ටී.ගුණවර්ධන මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 41 | කේ.ඒ.එච්.කේ.පෙරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 42 | පී.ඒ.එන්.අබේසේකර මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 43 | ඒ.ඩී.නාකන්දල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 44 | බී.ඩී.එස්.පී. කසීලාල් මයා | පරිපාලන නිලධාරිනී |
| 45 | ජේ.එම්.ඒ.කේ.ජයසේකර මිය | සංවර්ධන නිලධාරි |
| 46 | ජී.රත්නාවලී මිය | සංවර්ධන නිලධාරි |
| 47 | කේ.ජී.පී.දමයන්ති මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 48 | පී.කේ.කේ.ආර්.රාජකරුණා මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 49 | ජේ.ඒ.ඩී.සී.ජයකොඩි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 50 | ඩබ්.ඩී.පී. ප්‍රනාන්දු මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 51 | කේ.එල්.ඩබ්.සී.එල්.ද සිල්වා මෙය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 52 | ඒ.ඩී.එන්. මෙලානි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 53 | එන්.ඊ. ලියනගේ මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 54 | පී.එස්.ආර්.පීරිස් මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |

| | | |
|---|---|---|
| 55 | පී.ඩබ්.එන්.එස්. පතිරාජ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| 56 | ර්.ඒ.සී.එස්. එදිරිසිංහ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| 57 | නිමල් රංජිත් හෙට්ටි ආරච්චි මයා | කා.සේ.සේ. 1 |
| 58 | යූ.උපුල් රත්නකුමාර මයා | කා.සේ.සේ. 1 |
| 59 | එම්.ඩී.රසාංජන ප්‍රනාන්දු මයා | කා.සේ.සේ. 1 |
| 60 | එම්.ඒ.එල්.නලින් මයා | කා.සේ.සේ. 1 |
| 61 | පි.එස්. අජිත් මයා | කා.සේ.සේ. 1 |
| 62 | පී.ධර්මසිරි මයා | කා.සේ.සේ. 1 |
| 63 | එස්.ඉරුදයරාජ් මයා | කා.සේ.සේ. 1 |
| 64 | ඩී.එම්.උපුල් කුමාර මයා | කා.සේ.සේ. 1 |
| 65 | එම්.වන්දන ප්‍රදීප් මයා | කා.සේ.සේ. 11 |
| 66 | එම්.පී.ආර්.රත්නායක මයා | කා.සේ.සේ. 11 |
| 67 | ඒ.එම්.ආර්.එස්.ඩී.කුමාර මයා | කා.සේ.සේ. 11 |
| 68 | ජී.එස්.රෝහණ මයා | කා.සේ.සේ. 11 |
| 69 | පී.සමන් කුමාර පෙරේරා මයා | කා.සේ.සේ. 11 |
| 70 | ඩබ්.එස්.යූ.කේ. සිල්වාමයා | කා.සේ.සේ. 11 |
| 71 | ඩබ්.ජී.එස්.බී.තෙන්නකෝන් මයා | කා.සේ.සේ. 111 |
| 72 | කේ.වී.ඩී.ඒ.පී.කරවිට මයා | රියදුරු 1 |
| 73 | ඒ.විජේතුංග මයා | රියදුරු 1 |
| 74 | ඒ.එම්. ලලිත් දීපාල් මයා | රියදුරු 1 |
| 75 | එස්.ජයසූරියර් මයා | රියදුරු 11 |
| 76 | පී.එස්.ආනන්ද මයා | රියදුරු 11 |
| 77 | පී.ඩී.ඩී.පුෂ්පකුමාර මයා | රියදුරු 11 |
| 78 | ඩබ්.එම්.එන්. කරුණාතිලක මයා | රියදුරු 11 |
| 79 | ඩී.එම්.ඩී.ශිරෝන් මයා | රියදුරු 11 |
| 80 | ඩී.බී.දිසානායක මයා | රියදුරු 11 |
| 81 | ඩී.ජී.බැසිල් සමන්ත මයා | රියදුරු 11 |
| 82 | ර්.ඒ.එස්.එස්. එදිරිසිංහ මයා | රියදුරු 11 |
| 83 | ජේ.ජී.යු. විමලසිරි මයා | රියදුරු 11 |
| 84 | සුනිල් ලියනආරච්චි මයා | රියදුරු 11 |

**2015 වර්ෂයේ ස්ථාන මාරුවී පැමිණි නිලධාරින්**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | ඒ.ආර්.වික්‍රමරත්න මයා | අධ්‍යක්ෂ |
| 02 | ඒ.කේ.ගුණසේකර මෙනවිය | අධ්‍යක්ෂ |
| 03 | ටී. ප්‍රශාන්ත් මිය | අධ්‍යක්ෂ |
| 04 | ආර්.එච්.සී.කේ.රාමසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 05 | කේ.ජී.ආර්.ජී.ආර්.වික්‍රමවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 06 | එම්.ඒ.එස්.දබරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 07 | එස්.එම්.ඩී.ඩී.සමරකෝන් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 08 | කේ.ඒ.එච්.කේ.පෙරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 09 | ඒ.ඩී.නාකන්දල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 10 | අයි.ටී.එන්.මෙන්ඩිස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 11 | බී.ඩී.එස්.පී.කසීලාල් | පරිපාලන නිලධාරි |
| 12 | ජී.රත්නාවලි මෙය | සංවර්ධන නිලධාරි |
| 13 | පී.ධර්මසිරි මයා | කා.සේ.සේ. 1 |
| 14 | එස්.ඉරුදයරාජ් මයා | කා.සේ.සේ. 1 |
| 15 | ඩී.එම්.උපුල් කුමාර මයා | කා.සේ.සේ. 1 |
| 16 | ඩබ්.ජී.එස්.බී.තෙන්නකෝන් මයා | කා.සේ.සේ. 111 |
| 17 | සුනිල් ලියනආරච්චි මයා | රියදුරු |

**2015 වර්ෂයේ ස්ථාන මාරුවී ගිය නිලධාරින්**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | සී.විජයවර්ධන මිය | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | එන්.යූ.එන්.මෙන්ඩිස් මයා | අධ්‍යක්ෂ |
| 03 | ආර්.පී.එස්.ජේ.ගුණවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| 04 | වී.සී.විජේවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 05 | කේ.ජී.ආර්.ජී.ආර්.වික්‍රමවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 06 | ආර්.කේ.එම්.එන්.එන්.පලිපාන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 07 | ජී.අරුණන් මයා | සහකාර අධ්‍යක්ෂ |
| 08 | ඩී.පී.එස්.එම්.දයාසේකර මයා | සහකාර අධ්‍යක්ෂ |
| 09 | ආර්.ජී.පී. ද සිල්වා මයා | සහකාර අධ්‍යක්ෂ |
| 10 | ඒ.ඩී.නාකන්දල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 11 | ආර්.ඒ.ඩී.ලක්ෂ්මි මිය | පරිපාලන නිලධාරි |
| 12 | ආර්.ඒ.ඩී.කේ.රාජපක්ෂ මිය | රාජ්‍ය කළමනාකරන සහකාර |
| 13 | බී.ප්‍රියන්ත මයා | කා.සේ.සේ. |
| 14 | කේ.කේ.සී.කරස්නාගල මයා | කා.සේ.සේ. |
| 15 | එම්.ඒ.එස්.කේ.ජයවර්ධන මයා | රියදුරු |
| 16 | පී.ඩී.ඩී.පුෂ්පකුමාර මයා | රියදුරු |

**2015 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරින්**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | බී.ඩී.එස්.පී.කසිලාල් මයා | පරිපාලන නිලධාරි |

**විදේශ පුහුණුව සඳහා සහභාගී වීම - 2015**

| නම | විදේශීය පුහුණුව/සම්මන්ත්‍රනය | කාලය |
|---|---|---|
| එස් එස් මුදලිගේ මහතා අධ්‍යක්ෂ ජනරාල් | පිලිපීනයේ පැවති Regional Consultation Workshop which is scheduled වැඩමුළුව<br><br>සිංගප්පූරුවේ පැවති South Asia Sub Regional Economic Cooperation (SASER) 2025, Regional Consultation Workshop වැඩමුළුව<br><br>ජපානයේ පැවති South Asia Sub regional | 2015 මාර්තු 26 සිට 27 දක්වා<br><br>2015ඔක්තෝම්බර් 14 සිට15 |

| | | |
|---|---|---|
| | Economic Cooperation (SASEC) Trade Facilitation and Transport Working Group Meeting වැඩසටහන | 2015 නොවැම්බර් 26 සිට 27 දක්වා |
| එම් ගංගාදරන් මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | තායිලන්තය පැවති Second Meeting of Working Group on the Development of Seamless Connectivity වැඩසටහන<br><br>කාම්බෝජියාවේ පැවති Asia Women Leaders Program, වැඩසටහන | 2015 මාර්තු 26 සිට 27 දක්වා<br><br>2015 නොවැම්බර් 02 සිට 05 දක්වා |
| ශිරන්ති දම්මිකා රත්නායක මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | චීනයේ පැවති Invitation to South- South Learning Forum "Emerging Social Protection Systems in an Urbanizing World" වැඩමුළුව | 2015 නොවැම්බර් 09 සිට 13 දක්වා |
| කේ ඩී එස් ආර් පෙරේරා මහතා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | පිලිපීනයේ මැනිලා හී පැවති Evaluation Learning Event: Think Sustainable, Act Responsible<br><br>තායිලන්තය පැවති 03rd Session of the ESCAP Committee on Macroeconomic Policy, Poverty Reduction & Inclusive Development වැඩමුවව | 2015 සැප්තැම්බර් 15 සිට 16 දක්වා<br><br>2015 දෙසැම්බර් 01 සිට 03 දක්වා |
| එන් විජේවීර මෙය<br>අධ්‍යක්ෂ (මුදල්) | චීනයේ පැවති Seminar on Introduction and Utilization of Foreign Capital of Inland Regions for Developing countries වැඩමුළුව | 2015 ඔක්තෝම්බර් 19 සිට නොවැම්බර් 12 දක්වා |
| යූ එන් මල්ලවආරච්චි මහතා<br>අධ්‍යක්ෂ | තායිලන්තය පැවති the Asia – pacific Forum on Private Partnerships (PPPs) for Transport Infrastructure Development වැඩමුළුව<br><br>සවුදි අරාබියේ පැවති Draft of the Loan Agreement. වැඩසටහන | 2015 ජනවාරි 21 සිට 22 දක්වා<br><br>2015 ජූනි 12 සිට 16 දක්වා |
| චන්දිකා සේනානායක මිය<br>අධ්‍යක්ෂ | මැලේසියාවේ පැවති Strategic Thinking and Whole-of- Government Decision Making වැඩසටහන | 2015 මාර්තු 09 සිට 11 දක්වා |
| ටී ඒ ඩී දම්මික ප්‍රේමරත්න මහතා | කොරියාවේ පැවති Regional Development Cooperation Policy වැඩසටහන | 2015 ඔක්තොම්බර් 12 සිට නොවැම්බර් 01 දක්වා |

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | චීනයේ පැවති Core Course of 2015 Shanghai International Program for Development Evaluation Training, වැඩසටහන | නොවැම්බර් 09 සිට 15 දක්වා |
| ටී එම් ජේ බන්ඩාර මහතා<br>අධ්‍යක්ෂ | අබුඩාබියේ පැවති Abu Dhabi Ascent High Level Preparatory Meeting for Climate Summit වැඩසටහන<br><br>නේපාලයේ පැවති Workshop on Post 2015 Developing Agenda SAARC වැඩමුළුව<br><br>දෝහා හී පැවති Singapore - Qatar Regional Training Center for Public Administration: Course on "Town Planning" වැඩසටහන<br><br>චීනයේ පැවති Special Topics Course of 2015 Shanghai International Program for Development Evaluation Training වැඩසටහන | මැයි 04 සිට 05 දක්වා<br>4-5 May<br><br>සැප්තැම්බර් 26 සිට 28 දක්වා<br><br>2015 මාර්තු 23 සිට 26 දක්වා<br><br>නොවැම්බර් 16 සිට 20 දක්වා |
| එම් එෆ් ඒ මුබාරක් මහතා<br>අධ්‍යක්ෂ | කටාර් හී පැවති Training on Sustainable urban Planning වැඩසටහන<br><br>සිංගප්පූරුවේ පැවති Course on Sustainable Urban Development and Integrated Town Planning වැඩමුළුව<br><br>ජපානයේ පැවති Asia Leadership Programme on Sustainable & Climate Change වැඩසටහන | මාර්තු 03 සිට 06 දක්වා<br><br>2015 මාර්තු 16 සිට 25 දක්වා<br><br>2015 මාර්තු 02 සිට 07 දක්වා |
| ඒ කේ ගුණසේකර මිය<br>අධ්‍යක්ෂ | කොරියාවේ පැවති Development Cooperation Policy වැඩමුළුව | 2015 ඔක්තොම්බර් 12 සිට 24 දක්වා |
| චන්දිමා පුංචිහේවා මිය<br>සහකාර අධ්‍යක්ෂ | පිලිපීනයේ පැවති 5th ADB Skill International Forum වැඩසටහන | 2015 දෙසැම්බර් 01 සිට 03 දක්වා |
| දිස්නා අවන්ති නිහරේපොල මිය<br>සහකාර අධ්‍යක්ෂ | පිලිපීනයේ මැනිලා පැවති Impact Evaluation (IE) for Development Effectiveness වැඩසටහන | 2015 නොවැම්බර් 10 සිට 11 දක්වා |
| පී එම් එස් ජයතිලක මහතා<br>සහකාර අධ්‍යක්ෂ | නිව්යෝර්ක් හී පැවති Intergovernmental Negotiations on the Post - 2015 | 2015 ජුලි 20 සිට 31 දක්වා |

| | | |
|---|---|---|
| | Development Agenda වැඩසටහන<br><br>ඕස්ට්‍රේලියාවේ පැවති Capacity Building for Census Department to Conduct Post - war census වැඩමුළුව | 2015 නොවැම්බර් 02 සිට 27 දක්වා |
| ඩබ් එල් පී ප්‍රනාන්දු මිය<br>සහකාර අධ්‍යක්ෂ | නිව්යෝර්ක් හී පැවති Post - 2015 Development Agenda Negotiations at United Nations Headquarters, වැඩසටහන | 2015 මැයි 18 සිට 22 දක්වා |
| ආර් කේ එල් ජාගොඩ මිය<br>සහකාර අධ්‍යක්ෂ | සිංගප්පූරුවේ පැවති Course on Public Private Partnership in Development of Infrastructure Projects, වැඩමුළුව | 2015 නොවැම්බර් 16 සිට 20 දක්වා |
| ටී වයි එල් මුණසිංහ මෙය<br>සහකාර අධ්‍යක්ෂ | ජපානයේ පැවති Planning of Agricultural Policy වැඩමුළුව<br><br>මැලේසියාවේ පැවති Global Transformation Forum (GTF) වැඩසටහන | 2015 අගෝස්තු 16 සිට සැප්තැම්බර් 19 දක්වා<br><br>2015 ඔක්තොම්බර් 21 සිට 23 දක්වා |
| ඩී ඒ සී දිලානි පීරිස් මිය<br>සහකාර අධ්‍යක්ෂ | මැලේසියාවේ පැවති Project Management Towards Organizational Sustainability වැඩසටහන | 2015 අගෝස්තු 08 සිට 21 දක්වා |
| ඩබ් එම් හංසනී මිය<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Introducing Foreign Expertise and Global Professionals Development for Government Officials වැඩසටහන | 2015 මැයි 12 සිට ජූනි 01 දක්වා |
| කේ බී එස් එස් ප්‍රනාන්දු මහතා<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Infrastructure Construction and Planning for Sri Lanka වැඩමුළුව<br><br>ජපානයේ පැවති Enhancement of Solid Waste Management Capacity (Advance, Planning & Policy) වැඩසටහන | 2015 මාර්තු 19 සිට අප්‍රේල් 07 දක්වා<br><br>2015 ඔක්තොම්බර් 26 සිට නොවැම්බර් 21 දක්වා |
| එච් ජී වී කේ ටී ගුණවර්ධන<br>සහකාර අධ්‍යක්ෂ | ජපානයේ පැවති Training Programme on your Larders for Sri Lanka වැඩසටහන | 2015 ජනවාරි 19 සිට පෙබරවාරි 05 දක්වා |
| යූ ඒ ඩබ් එල් සුමනසේකර මෙය<br>සහකාර අධ්‍යක්ෂ | ජපානයේ පැවති Seminar on Economic Globalization and Made වැඩසටහන | 2015 මැයි 21 සිට ජූනි 10 දක්වා |
| එම් ඒ එස් දබරේරා මෙය<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Cooperation in Industrial Park Construction Between China and ASEAN Countries වැඩසටහන | 2015 මැයි 28 සිට ජූනි 17 දක්වා |
| කේ ඒ එච් කේ පෙරේරා මිය<br>සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Infrastructure Planning for Eurasia Countries වැඩසටහන | 2015 ජූලි 28 සිට අගෝස්තු 17 දක්වා |

| | | |
|---|---|---|
| එස් එම් ඩී ඩී සමරකෝන් මිය<br>සහකාර අධ්‍යක්ෂ | ජපානයේ පැවති Developing Human Resources Development Policy for Sustainable National Competitiveness වැඩසටහන | 2015 අගෝස්තු 06 සිට 26 දක්වා |
| ජී රත්නාවලී මෙය<br>සංවර්ධන නිලධාරි | මාලදිවයිනේ පැවති Workshop on Creation of Digital Repository වැඩසටහන | 2015 අගෝස්තු 09 සිට 13 දක්වා |

## 6 මූල්‍ය කාර්ය සාධනය - 2015

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වෙත ඉදිරිපත් කරනලද විසර්ජන ගිණුම්වල සඳහන් පරිදි වෙන්කරන ලද මුළුප්‍රතිපාදන සහ මුළුවියදම ,පුනරාවර්තන සහ මූලධන වශයෙන් පහත පරිදි සාරාංශ කළ හැක.

| **වැඩසටහනෙහි නම** | **2014** | | **2015** | | **වෙනස්වීමේ ප්‍රතිශතය ( % )2014)වර්ෂයේ සත්‍ය වියදම් මත)** |
|---|---|---|---|---|---|
| | **මුළු ප්‍රතිපාදනය (රුපියල්)** | **මුළු වියදම (රුපියල්)** | **මුළු ප්‍රතිපාදනය (රුපියල්)** | **මුළු වියදම (රුපියල්)** | |
| පුනරාවර්තන | 75,251,500.00 | 73,526,902.00 | 76,110,000.00 | 68,486,950.40 | 93.15 |
| මූලධන | 98,112,500.00 | 72,142,779.00 | 15,600,000.00 | 13,025,664.15 | 18.06 |
| **එකතුව** | **173,364,000.00** | **145,669,681.00** | **91,710,000.00** | **81,512,614.55** | **55.96** |